**<u>Trial Monitoring report (නඩු විභාග අධීක්ෂණ jd¾;dj)</u>**

**About the case (කුමන නඩුවක් සම්බන්ධයෙන් ද):** පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල වන බවට තොරතුරු ලැබී තිබියදීත් එය පොලීසියට වසන් කළේ යැයි චෝදනා කරමින් මොහොමඩ් ඊබ්‍රහිම් ඇතුළු විත්තිකරුවන් 03 දෙනෙකුට එරෙහිව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පවරා ඇති නඩුවකි.

**Case no (නඩු අංකය):** HC 3072/22

**Courts (අධිකරණය):** කොළඹ මහාධිකරණ අංක **7**

**Date of hearing (නඩුව අසන ලද දිනය):** 2025 ජුලි 02

**Author (s) of report (වා¾තාවේ කතෘ හෝ කතෘන්):** තරුෂි දිශාරා ප්‍රනාන්දු

**1. Who was in courts:**

| **Who** | **Names / other information** | **Comments** |
|---|---|---|
| **Judge (s) (විනිසුරු හෝ විනිසුරුවරුන්)** | | |
| **Attorney General's Dept. (නීතිපති දෙපාර්තමේන්තුව)** | නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් ලක්මිණි ගිරිහාගම | |
| **Police (CID / TID etc.) (පොලීසිය - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව/ත්‍රස්ත විමර්ශන ඒකකය/ වෙනත්)** | - | |
| **Accused / Suspects (චූදිත/ සැකකරුවන්)** | **1.** මොහොමඩ් යූසුෆ් මොහමඩ් ඊබ්‍රාහීම්<br>**2.** මොහමඩ් ඊබ්‍රාහීම් ඉජාස් අහමඩ්<br>**3.** මොහමඩ් ඊබ්‍රාහීම් ඉස්මයිල් අහමඩ් | |
| **Lawyers for accused / suspects (චූදිතයන් / සැකකරුවන් වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | ජනාධිපති නීතිඥ අනුජ ප්‍රේමරත්න<br>නීතිඥ චමින්ද අතුකෝරල | |
| **Aggrieved party (අගතියට පත් පාර්ශවය)** | - | |
| **Lawyers for aggrieved party (අගතියට පත් පාර්ශවය වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | - | |
| **Supporters of accused / suspects (චූදිතයන්ගේ / සැකකරුවන්ගේ ආධාරකරුවන්)** | - | |

| | | |
|---|---|---|
| **Supporters of aggrieved party (අගතියට පත් පාර්ශවයේ ආධාරකරුවන්)** | - | |
| **Others (වෙනත් අය)** | පැමිණිල්ලේ සාක්ෂි අංක 1 වෙනුවෙන් නීතිඥ රුවන් ප්‍රේමදාස මහතා සමඟ තවත් නීතිඥවරයකු පෙනී සිටින ලදී. | |

## 2. What happened in the court hearing (උසාවි විභාගයේදී සිදු වූ දේ)?

විත්තිකරුවන් තිදෙනාම අධිකරණයට පැමිණ සිටි අතර පැමිණිල්ලේ සාක්ෂි අංක 1,2 හා 4 දඅධිකරණයට පැමිණ සිටියේය.

1 වන විත්තිකරු වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥතුමන් තම සේවාදායකයා රෝද පුටුවකින් අධිකරණයට පැමිණ සිටියේය. පැමිණිල්ලේ සාක්ෂි 01 හී සාක්ෂි අවසන් බව විනිසුරුවරිය දැනුම් දෙන ලදී. විනිසුරුවරිය මෙම නඩුවට අලුත් බවත් එම නිසා මෙම නඩුවේ සිද්ධියම සාධක හා නඩුවේ දැන් පවතින පියවර සම්බන්ධයෙන් කෙටි විග්‍රහයක් නීති පති දෙපාර් තුමෙන්තුවෙන් ඉල්ලා සිටි අතර නීතිපති දෙපාර් තුමේන්තුව වෙනුවෙන් රජයේ නියෝජ්‍ය සොලිසිර් ජෙනරාල්වරිය කරුණු දැක්වීම සිදුකරන ලදී. ඒ අනුව විනිසුරුවරිය ප්‍රකාශ කරන ලද්දේ පූර් ව ගාමී විනිසුරුවරයා ලබා ගත් සාක්ෂි ඒ අයුරින්ම පිළිගන්නා බවත් එතන් පටන් නඩුවේ කටයුතු ඉදිරියට කරගෙන යන බවත්ය.

පැමිණිල්ලේ සාක්ෂි 04 අධිකරණයට කැඳවන ලදී. සාක්ෂිකාරියගේ මව් භාෂාව දමිල වුවත් සාක්ෂිකාරියගේ කැමැත්ත මත සිංහලෙන් සාක්ෂි ලබා දීම සිදුකරන බව ගරු අධිකරණයට ප්‍රකාශ කරන ලදී. සාක්ෂිකාරිය ගෙන් රජයේ නි. සො. ජෙ අසා සිටින ලද්දේ සාක්ෂිකාරිය කුමන වසර දක්වා අධ්‍යාපනය හදාරා තිබෙන බවද යන්නයි.ඒ අනුව සාක්ෂිකාරිය ප්‍රකාශ කලේ ඇය 12 වසර වෙනකන් අධ්‍යාපනය ලබා තිබුනද විභාග කිසිවක් නොලියූ බවයි. ඇය පාසලේදීද ඉගෙන ගත්තේ දමිළ භාෂාවෙන් බවත් මෙහෙකාර සේවයට පැමිණීමෙන් පසුව සිංහල භාෂාව ඉගෙන ගත් බව ප්‍රකාශ කරන ලදී.

දිවුරුම් ලබා ගැනීමෙන් අනතුරුව සාක්ෂි අංක 4 න් රජයේ නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්වරිය විමසා සිටියේ අධිකරණයේ චූදිත කුඩුවේ සිටින පුද්ගලයන් සාක්ෂිකාරිය අඳුරගන්නේද කියා. ඇය විසින් පළමු චූදිත , දෙවන චූදිත හා තෙවන චූදිතයන් ඍජුවම හැදිනගන්නා ලදී.

මෙහිදී පැමිණිල්ලේ නීතිඥවරිය අධිකරණයෙන් ඉල්ලා සිටියේ පැ.1 (ඉ) ලෙස සැලකෙන සාක්ෂිය අධිකරණයට ඉදිරිපත් කළ යුතු බවත් එය සමකාලීන රෙකෝඩරයක් බවයි. එහිදී සමකාලීන රෙකෝඩනය පෙන්වා සාක්ෂි වීමසීමට අවසර ඉල්ලා සිටියේය. එහිදී විනිසුරුවරිය ප්‍රකාශ කර සිටියේ සමකාලීන රෙකෝඩය පෙන්වා සාක්ෂි විමසීමට පෙර අදාළ සිද්ධිය සම්බන්ධයෙන් සාක්ෂි ලබා ගැනීම ප්‍රථමයෙන් සිදු කරන ලෙසයි.

ඒ අනුව රජයේ නි.සො. ජෙ වරිය පැ. සා 04 ගෙන් සාක්ෂි විමසීම ආරම්භ කරන ලදී. ඇය විසින් සාක්ෂිකාරියගෙන් විමසා සිටියේ 2019 අප්‍රේල් මස 09 වෙනිදා ඇය සේවය කරන ලද නිවස සිදු වූ සිදුවීම් සම්බන්ධයෙන්ය. ඇය මෙහෙකාර සේවයේ යෙදන නිවසෙන් පසුව ඇය හා නිවසේ අයිතිකරුවන් පිටව ගොස් දෙමටගොඩ නිවසකට පැමිණි සිද්ධිය හා එහිදී පුපුරන ලද බෝම්බ දෙක සම්බන්ධයෙන් ඇය සාක්ෂි ලබා දෙන ලදී.ඒ අනුව පැ.සා 04 ප්‍රකාශ කරන ලද්දේ 2019 අප්‍රේල් 09 වෙනිදා ඇය උදෑසන තුන්වන වූදිතගේ නිවසේ මෙහෙකාර සේවයේ යෙදුණු බවත් හවස් වන විට පළමු වූදිත වන තුන්වන වූදිතගේ පියාගේ නිවසට ගෙන ගිය බවයි. එහිදී දවල් කාලයේදී එකවරම පොලිස් නිළධාරීන් නිවසට පැමිණි බවත් ඔවුන් විසින් නිවසේ සියලු දෙනවාම පිටතට ගත් අතර ඒ සැණින්ම නිවසේ තුන්වන තට්ටුවෙන් බෝම්බ දෙකක් පුපුරා ගිය බවත් ඒ බෝම්බ සමගම නිවසේ සිටි ෆාතිමා හා ඇගේ දරුවන් මිය ගිය බව ඇය ප්‍රකාශකර සිටින ලදී.

දීර් ඝ සාක්ෂි ලබා දීමකින් අනතුරුව රජයේ නි.සො. ජෙනරාල්වරිය අධිකරණයෙනේ ඉල්ලා සිටියේ සමකාලීන රෙකෝඩය විවෘත අධිකරණයේ වාදනය කිරීමට අවස්ථාව ලබා දෙන ලෙසය. එහිදී විනිසුරුවරිය හා රජයේ නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්වරිය අතර සංවාදයක් සිදු වන ලදී. විනිසුරුවරියගේ මතය වුයේ අදාල සිදුවීම සම්බන්ධයෙන් ඍජු සාක්ෂි පැවතීමේදීත් සමකාලීන රෙකෝඩයක් වාදනය කිරීමෙන් ඍජු සාක්ෂි වලට යම් බලපෑමක් හෝ පැ.සා 04 සාක්ෂි හී නිරවද්‍යාතාවයට යම් බලපෑම් සිදු වන බවයි. රජයේ නි.සො. ජෙ ප්‍රකාශ කලේ සමකාලීන තාක්ෂික සාක්ෂි, සාක්ෂි පනතට අනුව ඒ ආකාරයෙන්ම බාරගත යුතු බවත් එය ඒ ආකාරයෙන්ම වලංගු වන බවත්ය.එසේම ඇය වැඩි දුරටත් ප්‍රකාශ කලේ මෙම අවස්ථාවෙදී පැමිණිල්ල විසින් උත්සහ කරන්නේ ඍජු සාක්ෂි හා සමකාලීන තාක්ෂිණික සාක්ෂි සංයෝගයක් වශයෙන් ලබා දී සාක්ෂි වල ශක්තිමත්භාවය තහවුරු කිරීමට බවයි. නමුත් විනිසුරුවරිය දිගින් දිගටම ප්‍රකාශ කර සිටියේ මෙම විඩියෝ පටය වාදනය කලහොත් එයින් පැමිණිල්ලේ සාක්ෂිකාරියගේ සාක්ෂි වල වටිනාකම අඩු වන බවයි. නමුත් විත්තිය විසින් මෙම සමකාලීන තාක්ෂිණ සාක්ෂි වාදනය කිරීමට කිසිදු විරෝධතාවක් නොදැක්වූ බැවින් විනිසුරුවරිය විසින් ප්‍රකාශ කලේ අධිකරණය විසින් එම සාක්ෂිය වාදනය කිරීමට අවසර ලබා දෙන බවයි.

ඒ අනුව පැ. සා. 1 (ඉ) වීඩියෝ පටය ගරු අධිකරණය ඉදිරියේදී කවරයෙන් ඉවතට ගෙන ගරු අධිකරණයට පෙන්වා වාදනය කිරීම සදහා යොමු කරන ලදී. එහිදී රජයේ නියෝජ්‍ය සොලිසටර් ජෙනරාල්වරිය ප්‍රකාශ කලේ සම්පූර් ණ විඩියෝ පටයේ දර් ශන පැයක් පුරාවට ඇති බවත් එබැවින් මිනිත්තු 11:**11:41**කාලයට අයත් දර් ශනයේ සිට ඉදිරියට වාදනය කරන ලෙසයි. ඒ අනුව එම දර් ශනයට අනුව තුන්වන වූදිත , ඔහුගේ බිරිද , දරුවන් දෙදෙනා හා පැමිණිල්ලේ සාක්ෂි අංක 4 ත් දෙමටගොඩ නිවසට පැමිණි ආකාරයත් පසුව නිවසේ බෝම්බ පුපුරා යන ආකාරයත් පිටතින් පෙනන ආකාරය සටහන් වී තිබුණි.

පැ. සා 04 එම දර් ශන පටය පිළිගැනීමෙන් අනතුරුව පැමිණිල්ලේ මූලික සාක්ෂි අවසන් විය. පසුව පළමු වූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීම ආරම්භ කරන ලදී. එහිදී සාක්ෂිකාරිය ප්‍රකාශ කල කරුණු සම්බන්ධයෙන් හරස් ප්‍රශ්න අසමින් යන විටදී විත්තියේ නීති ඥවරයා සාක්ෂිකාරියගෙන් අසන ලද්දේ බෝම්බ පිපිරීමෙන් පසුව සාක්ෂීකාරිය එදින රාත්‍රියේ සිටියේ කෙහෙද බවත් රාත්‍රී ආහාරය ලබා ගත්තේ කෙහෙද බවත්.එහිදී

සාක්ෂිකාරිය ප්‍රකාශ කරන ලද්දේ දෙමටගොඩ පොලිසියේ රාත්‍රියේ සිටි බවත් එහිදී ප්‍රකාශයක් ලබා දීමෙන් අනතුරුව එහි සිටම රාත්‍රී ආහාර ලබා ගත් බවයි. එම අවස්ථාවේදී විත්තියේ නීති ඥවරයා දිගින් දිගටම එම ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රශ්න කරන ලදී. විත්තියේ නීති ඥවරයාට ප්‍රශ්න සහගත වූයේ අපරාධ පරීක්ෂණ දෙපාර් තුමේන්තුවට අනුව පැමිණිල්ලේ අංක 04 සාක්ෂිකාරියගෙන් ප්‍රකාශයක් සටහන් කරගන්නා ලද්දේ අපරාධ පරීක්ෂණ දෙපාර් තුමෙන්තුව පමණක් බවයි. නමුත් සාක්ෂිකාරිය ප්‍රකාශ කරන ලෙස ඇගෙන් දෙමටගොඩ පොලිසිය සිද්ධිය සිදු වූ දිනයේදී ප්‍රකාශයක් ලබා ගත් බවත් දෙමටගොඩ පොලිසිය හැරුණුම වෙනත් කිසිම පොලිසියකට ඇය සාක්ෂි ලබා නොදුන් බවත් ප්‍රකාශ කර සිටියා. එහිදී විත්තියේ ඉල්ලීම මත අපරාධ පරීක්ෂණ දෙපාර් තුමෙන්තුව විසින් පැමිණිල්ලේ සාක්ෂිකාරයගෙන් ලබා ගත් ප්‍රකාශනය පෙන්වා ඇගේ අත්සනද පෙන්වා සිටින ලදී. එහිදී ඇය ප්‍රකාශ කලේ අත්සන ඇගේ වුවත් ඇය ප්‍රකාශ කර සිටියේ ඇය කිසිදු දිනකදී අපරාධ පරීක්ෂණ දෙපාර් තුමෙන්තුවට නොගිය බවයි. තවදුරටත් අපරාධ පරීක්ෂණ දෙපාර් තුමේන්තුව ප්‍රකාශ කරන ලද්දේ දෙමටගොඩ පොලිසිය විසින් ප්‍රකාශන ලබා ගත් බව ඔවුන් නොදන්නා බවයි. එහිදී විනිසුරුවරිය ප්‍රකාශ කර සිටියේ දෙමටගොඩ පොලිසිය විසින් සාක්ෂි ලබා ගත් බව ඇයද දන්නා කරුණක් වන බවත් එය මහේස්ත්‍රාත් අධිකරණ වාර් තාවේ තිබෙන බවයි. නමුත් රජයේ නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්වරිය ප්‍රකාශ කලේ දෙමටගොඩ පොලිසිය විසින් පැ. සා අංක 04 න් ප්‍රකාශන ලබා ගත් බව නීතිපති දෙපාර් තුමෙන්තුවද නොදන්නා බවත් ඒ සම්බන්ධයෙන් දෙමටගොඩ පොලිසියෙන් විමසා කරුණු වාර් තා කරන ලෙස ඉල්ලා සිටිය යුතු බවයි.

සැබවින්ම දෙමටගොඩ පොලිසිය විසින් පැ. සා අංක 4 න් ප්‍රකාශනයක් ලබා තිබේද නැද්ද යන ගැටළුව අධිකරණය ඉදිරියට පැමිණි බැවින් එය ලිහා ගන්නා තුරු හරස් ප්‍රශ්න සිදුකරනගෙන යැමට නොහැකි බව අධිකරණයට දන්වා සිටි විත්තිය විසින් ප්‍රකාශ කලේ නිසි තොරතුරක් දෙමටගොඩ පොලිසියෙන් ලැබෙනා තුරු නඩුව කල් දැමීම උචිත බවයි. ඒ අනුව විනිසුරුවරිය පැමිණිල්ලෙන්ද ඒ සම්බන්ධව කැමැත්ත ලබා නඩුව කල් තැබීමට පියවර ගන්නා ලදී.

3. **Any significant observations inside court room and outside? (උසාවි කාමරය තුළ සහ පිටත සැලකිය යුතු නිරීක්ෂණ තිබේද?) –**

4. **Next date & time (ඊළඟ දිනය සහ වේලාව):** 2025 ජූලි මස 31 උදෑසන 8.30

5. **Media reports about the case on this date (මෙම නඩුව පිළිබඳ මාධ්‍ය jd¾;d):**